**වී අලෙවි මණ්ඩලය - 2015**

--------------------------------------------

වී අලෙවි මණ්ඩලයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය හා 1971 අංක 14 දරන වී අලෙවි මණ්ඩල පනතේ 30 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාව මණ්ඩලයේ සභාපති වෙත 2018 ජූලි 03දින නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

--------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

----------------------------

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

**1.4 මතය ව්‍යාවනය සඳහා පදනම**

-------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

**2. මූල්‍ය ප්‍රකාශන**

------------------

**2.1 මතය ව්‍යාවනය**

-------------------

මෙම වාර්තාවේ 2.2ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

### 2.2.1 ආයතනයේ අඛණ්ඩ පැවැත්ම

---

මණ්ඩලය මිලදීගෙන තිබූ වී තොග වෙළඳපොළ මිලට හා පිරිවැයට වඩා අඩු මිලකට විකිණීම හේතුවෙන් ඊළඟ කන්නයේ වී මිලදීගැනීම සඳහා අවශ්‍ය අරමුදල් සපයා ගැනීම හා අලෙවියෙන් වූ පාඩු පියවා ගැනීමට වාර්ෂිකව භාණ්ඩාගාරයෙන් සහ රාජ්‍ය බැංකු වෙතින් ණය ලබා ගැනීමට සිදු වී තිබුණි. 2009 වසරේ සිට 2015 වසර දක්වා වී මිලදී ගැනීම හා මෙහෙයුම් වියදම් සඳහා රු.මිලියන 40,935.96 ක් රජයේ බැංකු 03 කින් ලබාගෙන තිබුණු අතර 2017 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 17,965.3 ක ණය ශේෂයක් හා රු.මිලියන 623.9 ක ණය පොළියක් තවදුරටත් ගෙවීමට තිබුණි. මේ හේතුවෙන් රජයේ හෝ වෙනත් මූල්‍ය අනුග්‍රහයකින් තොරව මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම සඳහා පවත්නා අවදානමට බලපෑමක් නොවේය යන්න විගණනයේදී බැහැර කළ නොහැකි විය.

### 2.2.2 සම්බන්ධිත පාර්ශවයන් සමග ඇති ගනුදෙනු හෙළිදරව් කිරීම

---

මණ්ඩලයේ හිටපු සභාපතිවරයා, ආරම්භක අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස කටයුතු කරන "C.W.E.Construction and Engineering (Private) Limited" වෙත ආයතනයේ ඉදිකිරීම් කටයුතු පවරා සමාලෝචිත වර්ෂයේදී රු. 57,409,183 ක් ගෙවීම් කර තිබුණ ද එම ගනුදෙනු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

### 2.2.3 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

---

**ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 7**

---

ප්‍රමිතයේ 16 වගන්තිය අනුව සමාලෝචිත වර්ෂයේ විකුණන ලද ගොඩනැගිලි වලට අදාලව රු.1,800,000 ක් වූ විකුණුම් වටිනාකම මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා නොතිබුණි.

### 2.2.4 ගිණුම්කරණ අඩුපාඩු

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මණ්ඩලය සතු ගොඩනැගිල්ලක් රු.1,800,000 කට විකුණා තිබුණු අතර එහි පිරිවැය හා සමුච්චිත ක්ෂය ගිණුම් වලින් ඉවත් කර ගොඩනැගිල්ල විකිණීමේ ලාභය හෝ අලාභය විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයට ගැලපිය යුතු වුවද, රු.1,800,000 ක් වූ විකුණුම් මුදල පමණක් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ වෙනත් ආදායම් යටතේ දක්වා තිබුණි.

(ආ) ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයේ දක්වා තිබූ පෙර වර්ෂ ගැලපීම් රු.3,770,089 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ලාභයට ගලපා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉතිරි වී තොග භෞතික සත්‍යාපනය සිදු කර තහවුරු කිරීමකින් තොරව රු.16,450,997,581 ක් වූ පිරිවැය ඉතිරි තොග වටිනාකම ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි.

## 2.2.5 පැහැදිලි නොකල වෙනස්කම්

-------------------------------------

මුල්‍ය ප්‍රකාශනවල ජංගම නොවන වගකීම් යටතේ සමාලෝචිත වර්ෂය අවසාන දිනට දක්වා තිබුණු රු.5,492,938,778 ක් වූ රාජ්‍ය බැංකු ණය ශේෂය, ශේෂ තහවුරු ලිපියට අනුව රු.5,425,234,112 ක් වූයෙන් රු.67,704,666 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 2.2.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

-----------------------------------------

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

| | ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | හඳුනා නොගත් වී මිලදී ගැනීම් | 65,235,117 | විස්තරාත්මක තොරතුරු ශේෂ සනාථ කිරීම් |
| (ආ) | ගැනුම් පාලන ගිණුම | 49,743,530 | |
| (ඇ) | Rice Millers ණයට විකුණුම් | 45,249,804 | |
| (ඇ) | වියළීමේ පිරිවැය (Driage) | 493,529,927 | අදාල අනුපාතය තීරණය කිරීමේ අනුමැතිය |
| (ඉ) | ප්‍රාග්ධන දායකත්වය | 631,484,518 | තහවුරු කිරීමේ ලේඛන |
| (ඊ) | පොලිසැක් බෑග් වියදම | 123,185,563 | සැපයුම්කරුවන් හා මණ්ඩලය අතර අත්සන් කළ ගිවිසුම |
| (උ) | වෙනත් දීමනා | 28,336,705 | විස්තරාත්මක උපලේඛනය |
| (ඌ) | උපකරණ, ගොඩනැගිලි ද්‍රව්‍ය හා සේවක රක්ෂණය, ආරක්ෂක නිලධාරී නවාතැන්, ජලය හා විදුලිය | | |
| | (i) රඹෑව වී ගබඩාව | 550,000 | තහවුරු කිරීමේ ලේඛන |
| | (ii) තඹුත්තේගම වී ගබඩාව | 230,000 | |

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට රු.2,004,008,842 ක් වූ ණයගැති ශේෂය තුල වසර 5 කට වැඩි රු.10,591,838 ක්ද වසර 3 ත් වසර 5 ත් අතර රු.501,805,774ක්ද,වසර 1 ත් වසර 3 ත් අතර රු.1,470,801,401 ක් හා වසර 1 ට අඩු රු.20,809,829 ක ශේෂ ඇතුළත් වූ අතර එම ශේෂ අය කර ගැනීමට 2018 මාර්තු 20 දින දක්වාම කටයුතු කර නොතිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට රු.8,828,409,980 ක් වූ ණයහිමි ශේෂය තුල වසර 4 කට වැඩි රු.1,104,545,456 ක්, වසර 3 ත් වසර 4 ත් අතර රු.600,000,000ක්, වසර 1 ත් වසර 3 ත් අතර රු.597,309,986 ක් හා වසර 1 ට අඩු රු.6,526,554,538 ක ශේෂ ඇතුළත් වූ අතර එම ශේෂ නිරවුල් කර ගැනීමට 2018 මාර්තු 20 දින දක්වාම කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 188(2) | 2009 වර්ෂයේ සිට පැවත එන රු.9,865,603 ක් වූ උපලබ්ධි නොවූ තැන්පත් සම්බන්ධයෙන් මෙම රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2002 පෙබරවාරි 25 දිනැති අංක 01/2002 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | මණ්ඩලය සතු වාහනවල රාජ්‍ය ලාංඡනය සහිතව ආයතනයේ නම මුද්‍රණය කර නොතිබුණි. |

## 2.5 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

2012 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන වල අවසාන තොග යටතේ දක්වා තිබුණු සෝයා බෝංචි තොගයේ වටිනාකම රු.3,302,853 ක් හා සහල් තොගයේ වටිනාකම රු.84,972 ක් නිසි අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේදී ගිණුම් වලින් ඉවත් කර තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ මෙහෙයුම් අලාභය රු.1,773,170,546 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ මෙහෙයුම් අලාභය රු.1,126,931,765 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අලාභයෙහි වැඩිවීම රු.646,238,781 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව ආදායම රු.857,328,765 කින් අඩුවීම ඉහත අලාභය වැඩිවීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ හතරක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයට සාපේක්ෂව 2012 වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය සියයට 857 කින් පිරිහී තිබුණි. 2012 වර්ෂයට සාපේක්ෂව 2013 වර්ෂයේ සියයට 48 කින් මූල්‍ය ප්‍රතිඵලය වර්ධනය වී තිබුණු අතර 2013 වර්ෂයට සාපේක්ෂව 2014 වර්ෂයේ සියයට 9 කින්ද 2014 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේ සියයට 57 කින්ද මූල්‍ය ප්‍රතිඵලය පිරිහී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂයවීම් නැවත ගැලපීමේදී 2014 වර්ෂයේදී මණ්ඩලයේ රු.1,078,742,573 ක් වූ සෘණ දායකත්වය 2015 වර්ෂය වනවිට රු.1,717,543,386 ක සෘණ දායකත්වයක් දක්වා එනම් සියයට 59 කින් පිරිහී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

-------------------------------

### 4.1 කළමනාකරණ ක්‍රියාකාරකම්

--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 වර්ෂයේ මිලදී ගන්නා ලද වී තොග ගබඩා කිරීමට මණ්ඩලය සතු ගබඩා ප්‍රමාණවත් නොවීම හේතුවෙන් රාජ්‍ය වාණිජ විවිධ නීතිගත සංස්ථාවෙන් කොකුන් ගබඩා (තාවකාලික ගබඩා) 15 ක් රු.39,330,000 කට මිලදීගෙන තිබුණි. එසේ වුවද එක් එක් කලාපවලට අවශ්‍ය ගබඩා ප්‍රමාණය නිවැරදිව හඳුනා නොගැනීම නිසා අනුරාධපුරය හා ත්‍රිකුණාමලය කලාපයන්ට නිකුත් කරන ලද රු.10,488,000 ක් වූ ගබඩා 04 ක් නිශ්ක්‍රීයව පැවතුණි.

(ආ) කොකුන් ගබඩාවක් වසර 10 සිට වසර 15 අතර කාලයක් භාවිතා කළ හැකි බව රාජ්‍ය වානිජ විවිධ නීතිගත සංස්ථාව විසින් දන්වා තිබුණද අම්පාර කලාපයට නිකුත් කළ ගබඩා 06 න් අලුත්වැඩියා කිරීමකින් තොරව භාවිතා කළ නොහැකි ගබඩා 02 ක් තිබුණි.

(ඇ) මණ්ඩලය විසින් නිකුත් කර තිබුණු 2015 අප්‍රේල් 22 දිනැති අංක පීඑම්බී/එෆ්1/14/2015 දරන අභ්‍යන්තර චක්‍රලේඛය ප්‍රකාරව, අත්තිකාරම් ලබා ගන්නා දිනයේ සිට දින 07 ක් ඇතුළත එම අත්තිකාරම් මුදල පියවිය යුතු වුවද 2014 වර්ෂයේ සිට 2017 සැප්තැම්බර් 20 දක්වා ලබා ගෙන තිබුණු රු.4,601,739 ක් වූ අත්තිකාරම් වලින් රු.745,444 ක් 2018 මැයි 31 දින වනවිටත් පියවා නොතිබුණි. එසේම ලබා ගත් අත්තිකාරම් පියවා නොතිබියදී එම නිලධාරීන්ටම නැවත අත්තිකාරම් ලබා දී තිබුණි.

(ඈ) 2015 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය බැංකුවකින් ලබාගෙන තිබුණු බැංකු අයිරා ශේෂය රු.178,840,073 ක් වූ අතර ඒ සඳහා පොලිය රු.14,769,460 ක් වී තිබුණි.

### 4.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්

-----------------------------

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඉතිරි වී තොග යටතේ රු.54,385,222 ක් වූ මාර්ගස්ථ තොගය 2012 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පැවතුණු අතර එම වටිනාකම නිරවුල් කර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුලදීද කටයුතු කර නොතිබුණි.

### 4.3 ආර්ථික නොවූ ගනුදෙනු

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලය විසින් ගොවීන්ගෙන් වී අස්වනු මිලදී ගැනීමට ආසන්න අවස්ථාවේදී පොලිසැක් මළු මිලදී ගැනීමට ඇණවුම් කිරීම හේතුවෙන් අවම ලංසුව ඉදිරිපත් කල සැපයුම්කරුට සම්පූර්ණ මළු ප්‍රමාණය සැපයීමට නොහැකි වී තිබුණි. ඒ අනුව වෙනත් සැපයුම්කරුවන්ගෙන් ඉතිරි ප්‍රමාණය මිලදී ගැනීම නිසා එක් මල්ලකට රු.1.84 බැගින් මළු 700,000 ක් සඳහා රු.1,288,000 ක්ද, ශත. 37 බැගින් මළු 1,083,000 ක් සඳහා රු.400,710 ක්ද වශයෙන් එකතුව රු.1,688,710 ක් වැඩිපුර ගෙවීමට මණ්ඩලයට සිදු වී තිබුණි.

(ආ) නියමිත පොලිසැක්මළු අපේක්ෂිත කාල සීමාව තුල නොලැබීම නිසා ගොවීන් සතු මළුවල වී අසුරා භාරදෙන ලෙස ගොවීන්ට උපදෙස් ලබා දී තිබුණු අතර ඒ සඳහා එක් මල්ලකට රු.30 බැගින් අතිරේක ගෙවීම් කර තිබුණි. අනුරාධපුර කලාපයේ ගොවීන් සතු මළු 181,857 ක් සඳහා රු.5,455,710 ක් ගෙවා තිබුණද, ගොවීන් සපයා තිබුණේ නියමිත ප්‍රමිතියෙන් තොර පැරණි මළු බවත් එම මළු ඉක්මනින් දිරාපත් වී ඒ තුළ තිබුණු වී ගබඩා තුලට වැටී ඇති බව මණ්ඩලයේ අභ්‍යන්තර විගණක විසින් වාර්තා කර තිබුණි.

## 4.4 කොන්ත්‍රාත් ක්‍රියාවලිය

-----------------------------

සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යංශය හා ඒ යටතේ ඇති සියළුම ආයතනවලට අයත් ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය සහ නව ඉදිකිරීම් සමුපකාර තොග වෙළඳ සංස්ථාවට අනුබද්ධ ඉදිකිරීම් අංශයට භාරදෙන ලෙසට සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් 2010 සැප්තැම්බර් 06 දින නිකුත් කර තිබූ ලිපියක් පදනම් කරගෙන රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කිරීමකින් තොරව ගබඩා 04 ක අලුත්වැඩියා කිරීමේ කටයුතු සමුපකාර තොග වෙළඳ සංස්ථාවට පවරා තිබුණි. එසේ වුවද සමුපකාර තොග වෙළඳ සංස්ථාවට අනුබද්ධ ඉදිකිරීම් අංශයක් නොතිබුණු අතර මෙම කොන්ත්‍රාත් වෙනුවෙන් රු.57,409,183 ක් සංස්ථාවේ සභාපති වරයාගේ උපදෙස් මත පෞද්ගලික සමාගමක් වෙත ගෙවා තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

------------------------------------------

## 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-----------------------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/ 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව, මුදල් වර්ෂයක් සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වූවද, 2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2018පෙබරවාරි 06 දිනදීය.

## 5.2 වාර්ෂික වාර්තා සභාගත කිරීම

-------------------------------------

2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5 (4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය පරිදි වාර්ෂික කාර්ය සාධන වාර්තා මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුලත පාර්ලිමේන්තුවේ සභාගත කලයුතු වුවද 2014 වර්ෂයට අදාල කාර්යසාධන වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

---------------------------

විගණනයේදී අනාවරණය වු පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධති හා පාලනයන් | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) වාහන පාලනය | (i) ධාවන සටහන් නිසිපරිදි නඩත්තු නොකිරීම හා සටහන් වෙනස් කිරීම<br>(ii) වාහන ලැයිස්තුවක් පවත්වා නොගැනීම<br>(iii) වාහන ඉල්ලුම් කිරීම හා අනුමැතිය නිසිපරිදි සිදු නොවීම. |
| (ආ) මිලදි ගැනීම් පාලනය | (i) නියමිත කාලවකවානු වල මිලදී නොගැනීම<br>(ii) තොග ලේඛන පවත්වා නොගැනීම<br>(iii) මිලදී ගනු ලබන පොලිසැක් මලුවල ප්‍රමිතිය ප්‍රාදේශීය කාර්යාල විසින් පරීක්ෂා නොකිරීම |
| (ඇ) කොන්ත්‍රාත් පරිපාලනය | ප්‍රසම්පාදන පරිපාටියෙන් බැහැරව කටයුතු කිරීම |
| (ඈ) ගබඩා පරිපාලනය | (i) නිසි ප්‍රමිතියකින් යුතුව වී ගබඩා නොකිරීම<br>(ii) ගබඩා වාර්තා / ලේඛන යාවත්කාලීනව පවත්වා නොතිබීම |